


# උම්මහාතුල් මුඃමිනීන්

නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ බිරියන් **"උම්මහාතුල් මුඃමිනීන්" එනම් මුඃමීන්වරුන්ගේ මව්වරු යනුවෙන් හැඳින්වෙයි.** එතුමාණෝ එම කාන්තාවන් විවිධ වූ හේතු කාරණා මත අල්ලාහ්ගේ අණ හා අනුමැතියට අනුව විවාහ කර ගත්හ. එම උම්මහාතුල් මුඃමිනීන් කිහිප දෙනෙකු පිළිබඳ අප දැන ගනිමු.

## ★ සව්දා රළියල්ලාහු අන්හා මවු තුමිය

නබි සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ප්‍රථම බිරිඳ වන කදීජා රළියල්ලාහු අන්හා තුමිය වෆාත් වූ විට එතුමා දැඩි ශෝකයකින් පසු තම ජීවිතයේ ද ආගමික, සමාජ ජීවිතයේ ද තමන්ට ශක්තියක් වූ කදීජා රළියල්ලාහු අන්හා තුමිය අහිමි වීම, එතුමාගේ සිත පාරන්නක් විය. තව ද ගැහැනු දරුවන් සිව් දෙනෙකු රැක බලා ගැනීමේ වගකීම ද පැවරුණි.

මේ අවස්ථාවේ දී කව්ලා බින්ති හාකිම් යන සහාබිවරිය සව්දා රළියල්ලාහු අන්හා තුමිය විවාහ කර දීමට තැරැව්කාරිය ලෙස ක්‍රියා කළා ය. සව්දා රළියල්ලාහු අන්හා  තුමිය කුරෙයිෂි වංශයේ නජ්ජාර් ගෝත්‍රයට අයත් වූවා ය. ඇය සක්රාන් බින් අම්ර් රළියල්ලාහු අන්හු තුමා සමඟ පෙර විවාහ වී සිටියා ය. දෙදෙනා ම අබිසීනියා හිජ්රතයට සහභාගි වූහ.

දිනක්, සව්දා රළියල්ලාහු අන්හා තුමිය තම ඔඩොක්කුවේ චන්ද්‍රයා නිදා සිටින සේ සිහිනයක් දුටුවා ය. ඒ පිළිබඳව සැමියාට දැනුම් දුන් විට, "මගේ මරණය ළඟා වී ඇත; මගෙන් පසු ඔබ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විවාහ කර ගන්න." යැයි ආශිර්වාද කළේ ය. සව්දා රළියල්ලාහු අන්හා තුමිය සැමියා අහිමි ව ශෝකයෙන් පසුවන විට කව්ලා සමඟ සබැඳියාවක් ඇති විය. ඇයගේ උත්සාහයෙන් පියාගේ අනුමැතිය සහිත දිර්හම් 400ක මහ්රයක් ලබාගෙන නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විවාහ කරගත්තා ය. ඉන්පසු

කදීජා රළියල්ලාහු අන්හා තුමියගේ නිවසේ වාසය කළා ය.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා මදීනාවට හිජ්රත් කළ පසු එතුමාගේ බිරින්දෑවරුන් ද මදීනාවට කැඳවාගෙන එන ලදි.

සව්දා රළියල්ලාහු අන්හා තුමිය තරමක් උස ය; කාරුණික ය. විහිළු තහළුවෙන් කතා කරන්නී ය; යහපත් ව හැසිරෙන්නී ය; නැමදුම් වතාවත්හි දැඩි සේ නියැලෙන්නී ය. වයසින් වැඩි වුව ද තරුණ වයසේ සිටි ආයිෂා රළියල්ලාහු අන්හා තුමිය සමග ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ ගැහැනු දරුවන් සමග ද සෙනෙහසින් ජීවත් වූවා ය.

වයස අවුරුදු 80ක් පමණ ජීවත් වූ ඇය උමර් රළියල්ලාහු අන්හු තුමාගේ පාලන කාලයේ දී වෆාත් වූවා ය.

## ★ සෆිය්යා රළියල්ලාහු අන්හා මවු තුමිය

සෆිය්යා රළියල්ලාහු අන්හා තුමිය මදීනාවේ ජීවත් වූ යුදෙව් ජාතික බනූ කුරෙයිලා ගෝත්‍රයට අයත් වේ. බනූ කුරෙයිලාවරුන්ගේ නායකයා වූ 'හුයෙයි' නැමැත්තාගේ දියණිය සෆිය්යා රළියල්ලාහු අන්හා තුමිය වූවා ය.

ඇය ප්‍රථමයෙන් කනානා බින් අබි අල්හක්කු නැමැත්තා සමග විවාහ වී සිටියා ය. කයිබර් සටනේ දී මුස්ලිම්වරුන් ජය ගත් විට වැන්දඹුවක් වූ මැය සිරකාරියක ලෙස අල්ලාගනු ලැබිණි. එම අවස්ථාවේ දී එතනට පැමිණි පුද්ගලයකු සෆිය්යා රළියල්ලාහු අන්හා තුමිය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට ම පමණක් ගැළපෙන බව ප්‍රකාශ කර සිටියේ ය. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ ඇයට, ඉස්ලාමය ගෙන හැර දැක්වූහ. ඉස්ලාමය වැළඳගත් පසු සෆිය්යා රළියල්ලාහු අන්හා තුමිය හිජ්රි 7 දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සමග විවාහ විය. එවිට එතුමියගේ වයස අවු 17ක් විය.

වරක් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ බිරින්දෑවරුන් අතර අදහස් හුවමාරුවක් සිදු විය. එවිට සෆිය්යා යුදෙව් කාන්තාවක් බැවින් විහිළුවට ලක් විය. ආයිෂා රළියල්ලාහු අන්හා, හෆ්සා රළියල්ලාහු අන්හා යන අය කුරෙෂි ගෝත්‍රයට අයත් වූ බැවින් ඔවුහු තමන් උසස් යැයි සිතූහ. මේ පිළිබඳව සෆිය්යා රළියල්ලාහු අන්හා තුමිය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෙත ගොස් පැමිණිලි කළ විට 'හාරූන් තම පියා බවත් පියාගේ සහෝදරයා මූසා බවත් තම සැමියා මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා බවත් මොවුන් සියල්ලෝ ම නබිවරුන් බවත් නුඹ පිළිතුරු නොදුන්නේ මන්ද?' යැයි අසා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ සෆිය්යා රළියල්ලාහු අන්හා තුමිය සැනසූහ.

ඒ සමග ම "කුරෙයිෂි ගෝත්‍රිකයනි! කුලයේ ප්‍රෞඪත්වය පවසන ඔබගේ ජාහිලියියා පුරුදු අල්ලාහ් නැති කර දැමුවේ ය. සියල්ලෝ ම ආදම්ගේ දරුවෝ ය. ඔහු ද පසෙන් මවනු ලැබුවේ ය." යැයි තම බිරින්දෑවරුන්ට දේශනා කළහ. "සෆිය්යා ඉස්ලාමය වැළඳ ගත්තා ය. ඇයගේ ඉස්ලාමය අලංකාර" යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් ප්‍රශංසා කර ඇත. ඇය සිරකාරියගේ තත්ත්වයෙන් නිදහස් කිරීම, ඇයට ලබා දුන් මහ්රය වේ. මෙය අනෙකුත් භාර්යාවන්ට වඩා විශේෂ කරුණකි. විශිෂ්ට සූක්ෂම දැනුමක් ද, ධාර්මික යහගුණාංග ද, භාෂා - සාහිත්‍ය දැනුම ද ඇය තුළ දක්නට ලැබුණි. ඇය හිජ්රි 50 වසරේ දී 60 වන වියේ දී වෆාත් වූවා ය.

## ★ ජුවයිරියා රළියල්ලාහු අන්හා මවු තුමිය.

මැය බනූ මුස්තලික් ගෝත්‍රයේ නායකයාගේ දියණිය වේ. බනූ මුස්තලික් ගෝත්‍රය සමඟ පැවති සටනේ දී තාබිත් බින් කෙයිස් රළියල්ලාහු අන්හු තුමා විසින් මැය සිරභාරයට ගන්නා ලදි. ඇය නිදහස් කිරීමට රත්තරන් මිස්කාල් 9ක වන්දියක් ගෙවන මෙන් ඉල්ලා සිටියේ ය. තමන්ට එම වන්දිය ගෙවීමට නොහැකි වූ අවස්ථාවේ දී ඇය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා හමු වූවා ය. "මම ගෝත්‍ර නායකයෙකුගේ දියණියක් වෙමි. මගේ ඔටුන්න මුණින් අතට වැටී පසට යට වුණි. තාබිත් බින් කස්ගෙන් නිදහස ලබා ගැනීමට රත්තරන් ලබා දිය යුතු ය, එම රත්තරන් මා කොහෙන් ලබා ගන්නේ ද? මා වහලියක් ලෙස ජීවත් වන්නේ කෙසේ ද?" යැයි විමසුවා ය.

එවිට ඇයගේ මෙම වදන් හා සානුකම්පිත තත්ත්වය අවධානයට ලක් කළ නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා "ඔබගේ වන්දි මුදල මා ගෙවන්නේ නම්, නිදහස් කාන්තාවක ලෙස සිටීමට හා මගේ පවුලේ සාමාජිකයෙකු ලෙස සිටීමට ඔබ එකඟ වන්නේ ද?" යැයි විමසූහ. එය සතුටින් පිළිගත් ඇය වහල් භාවයෙන් නිදහස් වූ විගස හිජ්රි වසර 5 දී හෝ 6 දී නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ බිරිඳක් ලෙස උසස් වූවා ය. එපමණක් නොව ඇයගේ ගෝත්‍රයට අයත් සිරකරුවන් 100 දෙනෙකු ද නිදහස් කර ගත්තා ය. එය දුටු ආයිෂා (රළි) තුමිය මෙසේ ප්‍රශංසා කළා ය. "ජුවෙයිරියා තම ගෝත්‍රයට බරකත් ලබා දුන්නාක් මෙන් කිසිදු කාන්තාවක තම ගෝත්‍රයට බරකත් ලබාදුන් අවස්ථාවක් මා දැක නැත."

පියා ඇය නිදහස් කර ගැනීමට පැමිණ, ඒ පිළිබඳව ඇයගේ අදහස විමසූ විට ඇය "තමන් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සමඟ ජීවත් වීම ප්‍රිය කරන බව'' සඳහන් කළා ය. "බර්රා" යන ඇයගේ නාමය නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා ජුවෙයිරියා ලෙස වෙනස් කළේ ය. ලස්සන හැඩරුව, මිහිරි කටහඬ, තීක්ෂණ දැනුම, අවංක භාවය, භාෂා නිපුණත්වය යනාදිය ඇය තුළ දක්නට ලැබුණි. මැය හිජ්රි වසර 50 දී 65 වන වියේ දී වෆාත් වූවා ය.

පාඩමේ අන්තර්ගත අරාබි වචන

بَنُو قُرَيْظَة    قُرَيْش    مِثْقَال

## අභ්‍යාස

කෙටි පිළිතුරු ලියන්න.

1. නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ දෙවන බිරිඳ කවුරුන් ද? ඇයගේ ප්‍රථම සැමියා කවුරුන් ද?

2. සව්දා රළියල්ලාහු අන්හා තුමියගේ ගුණාංග හා සෆියියා රළියල්ලාහු අන්හා තුමියගේ ගුණාංග සංසන්දනය කරන්න.

3. සෆියියා රළියල්ලාහු අන්හා තුමියට හට ගත් දුක නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විසින් සනසනු ලැබුවේ කෙසේ ද?

4. සෆියියා, ජුවෙයිරියා රළියල්ලාහු අන්හා තුමිය යන දෙදෙනා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා විසින් විවාහ කරගනු ලැබීමට හේතු සංසන්දනය කර ලියන්න.